# ඉතා වැදගත්

සමූපකාර සේවක කොමිෂන් සභාව(බ.ප)
අංක 628,
ජනජය සිටි ගොඩනැගිල්ල
8 වන මහල, නාවල පාර
රාජගිරිය
2024.02. 26

බස්නාහිර පළාතේ
සියළුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති,
සභාපතිවරුන් වෙත.

<u>කොමිෂන් සභාව වෙත සමූපකාර සමිති මඟින් ඉදිරිපත් වන තොරතුරු වල පැවතිය යුතු නිරවද්‍යතාවය පිළිබඳවයි</u>

135 අභියාචනා පිළිබඳව හෝ ස්ථිර පත්වීම් , වැඩබැලීම, රාජකාරි ඉවුකිරීම හෝ කොන්ත්‍රාත් පත්වීම් අනුමත කිරීම සඳහා හෝ වෙනත් විවිධ අවශ්‍යතාවයන් සඳහා මෙම කොමිෂන් සභාව වෙත සමූපකාර සමිති මඟින් තොරතුරු ඉදිරිපත් කිරීමේදී සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබූ අවස්ථාවන් පිළිබඳව කොමිෂන් සභාව වෙත පසුකාලීනව කරුණු හෙළිදරව් වී තිබේ.නොසැලකිලිමත්කම නිසා හෝ චේතනාන්විතවම හෝ සමිති විසින් මෙලෙස කටයුතු කිරීමෙන් ඇතැම් පාර්ශ්වයන් විසින් නීත්‍යානුකූල නොවන වරප්‍රසාද භුක්ති විඳින අතර ඇතැම් පාර්ශ්ව දැඩි ලෙස අගතියට පත්වූ අවස්ථාවන් පැවතීමෙන් නිරාකරණය කරගැනීමට බොහෝ අසීරු ගැටළු කොමිෂන් සභාව හමුවට පැමිනි අවස්ථාද පවතින බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

02. එබැවින් මින් ඉදිරියට කොමිෂන් සභාව වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේදී වඩාත් සුපරීක්ෂාකාරී ලෙස කරුණු සොයා බැලීමෙන් අනතුරුව එම කාර්යය සිදුකිරීමේ වැදගත්කම පිළිබඳව මේ මඟින් අවධාරනය කරමි. සපයනු ලබන අසත්‍ය තොරතුරු පදනම් කර ගනිමින් කොමිෂන් සභාව ගනු ලබන තීන්දු තීරණ වලට අදාලව මතුවන ගැටළුකාරි තත්වයන් සම්බන්ධයෙන්, අදාල සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කල සමිති අධ්‍යක්ෂ මණ්ඩලය පූර්ණ වශයෙන් වගකිවයුතු වන බවද වැඩිදුරටත් දන්වමි.

කොමිෂන් සභා නියමය පරිදි



එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත් :1. ලේකම්, පළාත් මාර්ග , ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) - කා.දැ.ගැ.පි
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප) - කා.දැ.ගැ.පි